# උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

## උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකරියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2021

උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා ඇති පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 01.02.2021 වන දිනය වේ.

| අනු අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | බස් නැවතුම්පළේ කාර්යභාර නිලධාරී (OIC Bus Stand) | 06 |
| 02 | හදිසි වැටලීම් නිලධාරී (Flying Squad Officer | 10 |
| 03 | කළමනාකරණ සහකාර | 05 |

**02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :**

02.1 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද අදාළ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කර ඇති කොන්දේසිවලට එකගව තොරාගනු ලබන අපෙක්ෂකයන් ඉහත තනතුරු සඳහා පත්කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත් වෙන අපේක්ෂකයන් පත්කර ගන්නා වූ දින සිට වසර තුනක කාලයක් පරිවාස පදනම මත පත්කර ගනු ලැබේ. මෙම තනතුර ස්ථිරයි සේවක අර්ථසාධන අරමුදල සඳහා හිමිකම් සහිතයි. බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි ඉහත කී තනතුරු සඳහා පත්කර ගන්නා වූ දිනයේ සිට වසර තුනක කාලසීමාව තුළදී පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුයි.

02.3 මෙම සේවාවන් ස්ථාන මාරුවලට යටත්ය. එබැවින් මෙම පත්වීම්ලාභීන් උතුරු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුයි

02.4 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම් වලංගු දිනය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ. නිවේදන කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවෙන් කිහිපයක් හෝ සියළුම පුරප්පාඩු නොපිරවීමේ අයිතිය පත්වීම් බලධාරියා සතුවේ

**03. වැටුප් පරිමාණය :**

ඉහත කී තනතුරු සඳහා වන මාසික වැටුප් පරිමාණය රු. 27,910-10x300 – 7x350 – 4x495 – 2x660 -48540 වේ

**04. සාමාන්‍ය සුදුසුකම් :**

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පූර්වාසන්න හය (06) වසර තුළ අවම වශයෙන් වසර තුනක් (03) උතුරු පළාත තුළ අඛණ්ඩ පදිංචිකරුවකු විය යුතුයි.

**හෝ**

අයදුම්කරු හෝ අයදුම්කරුගේ දෙමාපියන් උතුරු පළාත තුළ උපන් අයවලුන් විය යුතු අතර අඛණ්ඩව වසර පහක් උතුරු පළාතේ පදිංචි අයවලුන් විය යුතුයි

**(ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ඡන්දහිමි නාම ලේඛනයෙන් උපුටාගත් උපුටනයක් ඉදිරිපත් කළ යුතුයි)**

04.3 අයදුම්කරු උතුරු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික යෝග්‍යතාවයක් තිබිය යුතු අතර විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි

04.4 අයදුම්කරු අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම සෑම ආකාරයකින්ම සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුයි

04.5 අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :

05.1 අධ්‍යාපන සුදුසුකම් :

01. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙමළ/සිංහල ගණිතය හා ඉංග්‍රීසි ඇතුළු විෂයයන් හතරකට (04) සම්මාන සහිතව විෂයයන් හයක් (06) එකවර සමත්වී තිබිය යුතුයි

02. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂය හැර අනෙකුත් සියළුම විෂයයන් එකවර සමත්වී තිබිය යුතුයි

## 06. බඳවා ගැනීමේ පරිපාටිය :

06.1 ලිඛිත විභාගයේ දී දක්වනු ලබන දක්ෂතාවය මත බඳවා ගැනීමේ අවස්ථාවේ බලපැවැත්වෙන චක්‍රලේඛ බඳවා ගැනීමේ පරිපාටිය ජාතික හා පළාත් ප්‍රතිපත්තිවලට අනුකූලව බඳවා ගනු ලැබේ මෙම දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ණයේ දී පරීක්ෂා කරනු ලැබේ අවශ්‍ය සුදුසුකම් සපුරා නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුරු සඳහා වන හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ සම්මුඛ පරීක්ෂණයේ දි සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ලකුණු කිසිවක් ලබා දෙනු නොලැබේ

06.2 ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන්, ලිඛිත විභාගය සමත්වූ අපේක්ෂකයන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙල අනුව පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ.

06.3 තෝරාගනු ලබන අපේක්ෂකයන් ලිඛිත විභාගයේ දී එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් ලබාගත යුතුයි.

## 07. විභාග ගාස්තු :

අයදුම්කරු පදිංචිව් සිටින උතුරු පළාතේ පිහිටි ලංකා බැංකු ශාඛාවක රු 500/- ක මුදලක් "සභාපති උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය" සඳහා වූ "83642721" අංකය දරණ ගිණුමට බැර කර ලබාගත් ලදුපත අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ අලවා එවිය යුතුයි කිසිදු හේතුවක් නිසා හෝ මෙම මුදල ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක් සඳහා ද මෙම මුදල මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

## 08. අයදුම් කිරීමේ ක්‍රමය :

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයෙන් යුත් කඩදාසියක අයදුම්පත සකස් කර ගත යුතුයි සම්පූර්ණ කරන ලද අයදුම්පත 01.02.2021 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි "**සභාපති, උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, අංක 45, රක්කා පටුමග, චුණ්ඩුකුලිය, යාපනය.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

08.2 අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුයි.

08.3 අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකි අතර එම අයදුම්පතේ ඡායා පිටපතක් හෝ ඍජු පිටපත් භාරගනු නොලැබේ. විභාග ප්‍රවේශපත්‍ර උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු සුදුසුකම් සියල්ල සපුරා ඇති බවට සනාථ කිරීමක් නොවේ.

08.4 අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත අවම වශයෙන් විභාගය පැවැත් වෙන දිනයට, දින තුනකට(03) ප්‍රථම හෝ ප්‍රවේශ පත්‍ර ලැබී නොමැති නම් ඒ පිළිබඳව පහත සඳහන් විස්තර සමඟ "**සභාපති, උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය, අංක 45, රක්කා පටුමග, චුණ්ඩුකුලිය, යාපනය.**" යන ලිපිනයට වහාම දැන්විය යුතුයි. (**දුරකථන අංකය – 021-2215967, ෆැක්ස් අංකය 021-2215966**)

**සටහන :**

තොරතුරු සඳහන් ලිපියක්, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, අයදුම්කරුගේ තැපැල් ලිපිනය, අයදුම්පතේ පිටපතක්, අයදුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදංචි අංකය හා දිනය, විභාග ගාස්තු ගෙවන ලද ලදුපතේ සහතික කළ ඡායා පිටපත, විභාග ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :

අපේක්ෂකයන් විසින් තමන් පෙනී සිටින එක් එක් විෂයයන් සඳහා විභාග ශාලාධිපති සෑහීමට පත්වන පරිදි තම අනන්‍යතාවය සනාථ කළ යුතුයි අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 10. ව්‍යාජ තොරතුරු සඳහා වන දඩුවම් :

අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු සැපයීමට වගබලා ගත යුතුයි. විභාග නියමයන් පරිදි යම් අයදුම්කරුවකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව කොයි මොහොතකදී හෝ සුදුසුකම් සපුරා

නැති බවට අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් සපයා ඇති කිසියම් තොරතුරක් සාවද්‍ය තොරතුරක් බවට අනාවරණය වන කොයි මොහොතක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

## 11. විභාග පරිපාටිය :

මෙම ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වන අතර දෙමළ සිංහල යන භාෂා මාධ්‍යයන් මඟින් මෙම විභාගය පවත්වනු ලැබේ. අයදුම් කළ මාධ්‍යය පසු වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | ප්‍රශ්න පත්‍රයේ අන්තර්ගතය | කාලය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | භාෂා හැකියාව | ප්‍රකාශ කිරීම, වටහා ගැනීම, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනාව, ඉදිරිපත් කළ ලිපියක් සකස් කිරීම,ඉදිරිපත් කරන ලද දත්ත උපයෝගි කරගනිමින් ප්‍රස්ථාර හා වගුවක් සකස් කිරීම, ඉදිරිපත් කරන ඡේද සම්පිණ්ඩනය කිරීම, වාක්‍යයන් කිහිපයක් තුළ අන්තර්ගත වූ කරුණු තනි වාක්‍යයෙන් ලිවීම, සරල ව්‍යාකරණ ක්‍රම භාවිතය, යනාදි කරුණු කෙරෙහි අපේක්ෂකයන්ගේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්නපත්‍රයකි. | පැය 2 යි | 100 |
| 02 | අභියෝග්‍යතාවය හා සාමාන්‍ය දැනුම | අපේක්ෂකයාගේ ගණිතමය හැකියාවන්, තර්කානුකූලව සිතීමේ හැකියාව හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි | පැය 1 යි | 100 |
| 03 | පරිගණක නිපුණතාවය | තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සිද්ධාන්ත, Windows operating systems & file Management. | පැය 1 යි | 100 |

**සැ.යු.**

සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට ලිඛිත විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍ර සඳහා ම අවම ලකුණු 40% ක් ලබා ගත යුතු අතර මුළු ලකුණු ප්‍රමාණයෙන් අවම ලකුණු 50% ක් ලබා ගත යුතුයි.

## 12. විභාග ප්‍රතිඵල :

විභාගයට පෙනී සිටින ලද අපේක්ෂකයන් සියළු දෙනාගේම ප්‍රතිඵල යථා කාලයේ දී තැපැල් මඟින් නිකුත් කරනු ලැබේ.

## 13. විභාගය පැවැත්වීමට යෝජිත විභාග නගර හා නගර අංකය පහත සඳහන් පරිදි වේ

| නගරය | නගර අංකය |
|---|---|
| යාපනය | 01 |
| මන්නාරම | 02 |
| වවුනියාව | 03 |
| කිලිනොච්චිය | 04 |
| මුලතිව් | 05 |

විභාග නගරයක් සඳහා යොමුවන අයදුම්පත් ප්‍රමාණයේ අඩුවක් දක්නට ලැබෙන විට මෙම විභාගය ආසන්නව පිහිටා ඇති විභාග නගරයට මාරු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීමේ බලතල උතුරු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති සතුය. මෙම දැන්වීමේ දෙමළ හා සිංහල භාෂා පරිවර්තනයන්හි යම් කිසි අනනුකූලතාවයක් දක්නට ලැබෙන අවස්ථාවන් වලදී දෙමළ භාෂා මාධ්‍යයයේ ඇති දැන්වීම ප්‍රකාර කටයුතු කරනු ලැබේ.

සු.අමිර්තලිංගම්,

සභාපති,

මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය,

උතුරු පළාත.